35 වන පිටෙන්




බලන්නට වූහ. අප දැන සිටි සමහර ඉංග්‍රීසි වචන එකතු කර ඔවුන්ගෙන් භාජන ඉල්ලා ගත් වහාම අපි ආහාර පිසීම පටන් ගත්තෙමු. සකස් කළ ආහාර අපේ වාහනවලින් රැගෙන ගොස් ජනතාව අතරේ බෙදා දුන්නෙමු. අනෙක් පසින් හමුදාවත් අහාර බෙදා දුන්නේය.

සහනාධාර ලොරිවලින් රැගෙන ඇවිත් තිබුණු ඇඳුම් සටන්කාමීහු ජනතාව අතරෙහි බෙදා දුන්හ. හමුදාවද ට්‍රැක්ටර්වලින් ගෙනා ඇඳුම් ජනතාව අතරේ බෙදා දුන්නේය. එකම නිවෙසක සිටින අමනාප වූ දෙදෙනෙක් අහක බලාගෙන තරඟයට වැඩ කරන්නා සේ මෙම ක්‍රියාකාරකම් සිදුවීය. වන්නියෙහි දී සිදුකළා සේ රාජ්‍ය නොවන ආයතනත්, වෙනත් සංවිධානත් ඒකාබද්ධ කිරීම පහසු කටයුත්තක් නොවීය. එහි වූ කඳවුරුවලට අපේ ස්වෙච්ඡා සේවකයන්ව සහ සටන්කාමීන්ව වගකීම් භාර අය ලෙස පත් කළේය. එක් පසෙකින් මුදාගැනීමේ කටයුතු හමුදාව ද සටන්කාමීහු ද එම ප්‍රදේශයෙහි සමාජ හිතෛෂීහු ද සිදු කරන්නට වූහ. මිය ගිය අයගේ මළ සිරුරු වළ දැමූහ. ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය සම්පත් ලබාගැනීම මහත් දුෂ්කර කාර්යයක් වීය.

සෑම කඳවුරකම වගකීම භාර අපගේ සටන්කාමීන්ව සහ ස්වෙච්ඡා සේවකයන්ව පත් කර තිබූ හෙයින් ඔවුන්ට අදාළ ස්ථානවල ජනතාව සමඟ එක්ව ආහාර පිස බෙදා දීමට හැකි විය. එම වැඩකටයුතු නිරීක්ෂණය සඳහා ජනතා කමිටු ඇති කර තිබුණි. ඔවුන් වෙත බෙදා දෙන භාණ්ඩ ඔවුන් සුරක්ෂිතව ගබඩාකර ලියාපදිංචි කිරීම සිදුවිය. එහි සිටි ජනතාවගේ පවුල් විස්තර, අවශ්‍යතා ආදිය ලැයිස්තු ගත කර තිබුණි. අපේ සටන්කාමීයෝ සහ ස්වෙච්ඡා සේවකයෝ එක්ව එවැනි පරිපාලනයක් ඇති කළ හෙයින් උපකාර කිරීමට ඉදිරිපත්ව පැමිණෙමින් සිටි ජනතාව ද සංවිධාන ද සෘජුවම කඳවුරුවලට ගොස් යට කී පරිපාලනයේ සහායෙන් ඔවුන් ගෙන ආ භාණ්ඩ නිවැරදිව බෙදා දීමට හැකි විය. සිංහල සහ මුස්ලිම් ජනයා බොහෝ දෙනෙක් ද සංවිධාන ද උපකාර කිරීම සඳහා පැමිණියහ.

නතරවීමකින් තොරව වැස්ස දිගටම ඇද හැලෙමින් පැවැති හෙයින් සාකාමම් ගඟ පිටාර ගලන්නට විය. තම්පට්ටෙ හරහා ගමන් කරන මුහුදුබඩ මාර්ගය දරුණු ලෙසින් හානියට පත්ව තිබිණි. ජනතාවට ටෙන්ට් රෙදි හදිසි අවශ්‍යතාවක්ව තිබිණි. බොහෝ සමාජ සේවා සංවිධාන ජාති ආගම් භේදයකින් තොරව උපකාර කළහ. මෙම දුෂ්කර අවස්ථාවේ කවුරුන්දැයි සොයා නොබලා පීඩාවට පත් ජනතාවට උපකාර ළඟා විය යුතුය යන්න පිළිබඳව සියලු දෙනා එකට එක්ව සිටියත් හමුදාවේ සහ අපේ සටන්කාමීන් අතර බොහෝ ස්ථානවලදී වාචික දබර ඇතිවිය. එක් අයෙකු කියන දෙයක් අනෙක් අයට නොතේරෙන හෙයින් සුළු දේවල් පවා ලොකු ගැටුම් ඇති කිරීමට සමත්විය. තමන් කියන එක අනෙකාට තේරුමක් නැතත් තම තමන්ගේ භාෂාවෙන් මහත් උස් හඬින් කතා කර දෙපාර්ශ්වයම රණ්ඩු වූහ.
තිරුක්කෝවිල් ප්‍රදේශයෙහි පිහිටි කුඩා පාසලක නතරව සිටි ජනයාට ලබා දීමට සටන්කාමී සහෝදරියෝ සහනාධාර ද්‍රව්‍ය ට්‍රැක්ටරයක පටවා ගෙන යන්නට වූහ. එහි පැමිණ සිටි හමුදාව සහ අපේ සටන්කාමීන් අතර ගැටුම්කාරී තත්ත්වයක් ඇතිවූ නිසා හමුදාව බර ආයුධ සවිකළ හමුදා වාහන සහිතව පැමිණ සිටින බවට මට දැනුම් දුන්නේය. මම ඒ මොහොතේ රාජ්‍ය නොවන සංවිධානයක රැස්වීමකට සම්බන්ධ වෙමින් සිටියෙමි. වහාම අදාළ ස්ථානයට ගිය විට දෙපාර්ශ්වයම දැඩි ලෙස වාද විවාද කරමින් මහත් කෝපයෙන් සිටිනු දක්නට ලැබුණි. සහනාධාර බෙදා දීම සඳහා සටන්කාමීන් ගිය මොහොතේ එම භාණ්ඩ තමන් වෙත භාර දෙන ලෙසත් තමන් ඒවා බෙදා දිය යුතු බවත් හමුදාව පවසා ඇත.

'මේවා අපි ගෙනා භාණ්ඩ. අපි තමයි බෙදා දෙන්නේ.' යැයි කියමින් එම භාණ්ඩ හමුදාව වෙත භාර නොදෙන බව ද සටන්කාමීන් පවසද්දී ඔබලා බෙදා දෙන විට තමන් ද සිටිය යුතු බව හමුදාව පවසා ඇත. හරියට භාෂාව නොදැන සිටීම නිසා ප්‍රශ්නය බර ආයුධ සහිත වාහනයක් ගෙන එන තරමට මහත් වූ ප්‍රශ්නයක් ලෙසින් වෙනස් වී තිබුණි. හමුදාව ආයුධ සමඟ එම ස්ථානයෙහි පිරී උන්නේය. එහි ස්වෙච්ඡා සේවකයෙකු ලෙසින් සිටි ඉංග්‍රීසි භාෂාව හොඳින් කතා කළ හැකි විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුගේ මාර්ගයෙන් ඔවුන්ගේ ඉහළ නිලධාරියාව හමුවීමට මම කැමැත්තෙන් සිටින බව පවසන විටම වාගේ එම හමුදා නිලධාරියා තම වාහනයෙන් බැස පැමිණියේය. මම ඔහුට මාව හඳුන්වා දී සටන් විරාම ගිවිසුමට අනුව අපි මෙහි දී ජනතාව අතරේ කටයුතු කිරීමට පැමිණ සිටින බවත්, ඔබලා අපට බාධා කිරීම ගිවිසුම උල්ලංඝනය කිරීමක් බවත් පැවසුවෙමි. ඔහු සිදුවූ දේ හමුදාවේ අයගෙන් ද අසා දැන ගත්තේය. ස්වල්ප මොහොතකින් හමුදා නිලධාරියා තම හට පිරිස් වහාම කඳවුරට පිටත් කළේය.

එම හමුදා නිලධාරියා, ජනතාවට උපකාර කිරීමට කිසිම බාධාවක් නොමැති බවත්, සුනාමි විපත සිදුවූ අවස්ථාවේ සිට හමුදාව විසින් ජනතාවට කරන ලද සේවාවන් පිළිබඳව මා සමඟ පැහැදිලි කළේය. තමන්ට හැකි අයුරින් තව දුරටත් උදව් කරන බව ද ඔහු පැවසුවේය. ඉන් පසු අපේ සටන්කාමී සාමාජිකයෝ තමන් රැගෙන ආ භාණ්ඩ කිසිදු ප්‍රශ්නයකින් තොරව ජනතාව අතරෙහි බෙදා දුන්හ.

මතු සම්බන්ධයි




**මහින්ද ගුණවර්ධන**

## අලුත් ඇඳුම්

යමඔකා ටෙස්ෂු අධිරාජයාගේ ගුරු-වරයෙක්. ඔහු මැනවින් සෙන් පුහුණු කළ අයෙක්. ඔහුගේ නිවස ඉබාගාතේ යන මිනිසුන්ට නවාතැනක් වුණා. ඔහුට තිබුණේ එක ම ඇඳුම් කට්ටලයක් පමණයි. ඔහු සෑම විට ම දිළින්දෙක්.



යමඔකාගේ ඇඳුම් ඉරී තිබෙන සැටි නිරීක්ෂණය කළ අධිරාජයා ඔහුට අලුත් ඇඳුම් මිල දී ගන්නට මුදල් දුන්නා.

ඊළඟ දවසේ යමඔකා පරණ ඇඳුම ම ඇඳගෙන අධිරාජයා හමුවේ පෙනී සිටියා.

"යමඔකා. අලුත් ඇඳුම්වලට මොකද වුණේ?" අධිරාජයා ප්‍රශ්න කළා.

"මම ඔබතුමාගේ දරුවන්ට ඇඳුම් අරන් දුන්නා." යමඔකා පැහැදිලි කළා.

*අධිරාජයාගේ දරුවන් යනු ජනතාවයි*

## සොල්දාදුවන් සහ ගුරුවරුන්

වරක් ජපන් හමුදා ඛණ්ඩයක් රහසිගත ප්‍රහාරවල යෙදෙමින් සිටිය දී හමුදා නිලධාරීන් කිහිප දෙනෙක් ගසන්ගේ පන්සල ඔවුන්ගේ මූලස්ථානය කර ගත්තා.

ගසන් අරක්කැමියාට උපදෙස් දුන්නා. " හමුදා නිලධාරීන්ටත් අපට වගේ ම සරල ආහාර වේලක් සකස් කරන්න."

හමුදා නිලධාරීන් බෙහෙවින් ගරු සැලකිලි ලැබීමට පුරුදු වූ අය. ඒ නිසා ඔවුන් කෝපයට පත් වුණා. එක් අයෙක් ගසන් වෙත පැමිණියා.

"ඔබ අප කවුරු කියලා ද හිතාගෙන ඉන්නේ? අපි රට වෙනුවෙන් දිවි පුදන සොල්දාදුවෝ. ඇයි අපට ඒ විදියට සලකන්නේ නැත්තෙ?" ඔහු ප්‍රශ්න කළා.

"ඔබ අප කවුරු කියල ද හිතාගෙන ඉන්නේ? අපි සචේතනික ජීවීන් හැම දෙනා ම බේරා ගැනීමට කැප වූ මනුෂ්‍යත්වයේ සොල්දාදුවෝ." ගසන් සැරෙන් පිළිතුරු දුන්නා.